**අතුරලිය ප්‍රාදේශීය සභාව - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අතුරලිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අතුරලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ---------------- | ------------ |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට මුළු අයහාරය රු.17,790,549 ක් වැඩියෙන් හා මුළු වියදම රු.811,975 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා අතිරික්තය රු.18,602,524 කින් වැඩිවී තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වරිපනම් ශේෂය රු.126,551 ක් අඩුවෙන් හා ශීර්ෂ හතරකින් ලැබිය යුතු ආදායම රු.598,218 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | රු.2,256,634 ක වටිනාකමින් යුතු ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන අයිතම 65 කට අයත් ඒකක 1249 ක් ලී බඩු හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | අපහරණයට නිර්දේශ කර තිබූ වත්කම් ඒකක 33 ක් හා පුස්තකාල පොත් 39 ක් ස්ථාවර වත්කම් වලින් ඉවත් කර තිබීම නිසා දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම රු. 65,248 කින් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | පසුගිය වර්ෂයේ ණයගිම් ප්‍රතිපාදන සලස්වා නොතිබූ රු.238,276 ක් වටිනා විවිධ වියදම් සඳහා ණයගිම් ප්‍රතිපාදන ඇති නොකර සමුච්චිත අරමුදලින් ගෙවීම් කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පසුගිය වර්ෂයේ ලැබිය යුතු ආදායම් ලෙස දක්වා නොතිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ ලද රු.2,920,506 ක් ආදායම් වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදන ඇති නොකර සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| මුල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන ගිණුම් විෂයයකට අදාල ශේෂය හා ඊට අදාල උපයෝගී ලේඛණ/උපලේඛණවල දැක්වෙන ශේෂය අතර රු.3,243,188 ක වෙනසක් පැවතිණි. | වර්ෂයට අදාල ඌනතාවය ගැලපීමට පෙර ශේෂය දක්වා ඇති බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

1.7 **අනුකූල නොවීම්**

1.7.1 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මු.රෙ. 772(1) | භාවිතයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ ඒකක 6 ක් විනාශ කර දැමීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම භාණ්ඩ ඒකක ඉදිරියේදී පවත්නා වෙන්දේසියකදී වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.16,271,215 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.196,720 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,212,500 | 2,097,815 | 1,801,569 | 1,968,200 | 2,262,500 | 1,392,865 | 1,455,502 | 1,671,954 |
| (ii) | කුලී | 3,834,000 | 3,975,731 | 5,284,650 | 76,167 | 3,854,000 | 5,973,359 | 4,998,780 | 1,385,086 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 325,000 | 264,075 | 206,573 | 320,152 | 317,000 | 308,140 | 275,840 | 262,650 |
| (iv) | වෙනත් ආදායම් | 1,101,000 | 2,453,040 | 2,572,946 | 202,893 | 1,140,000 | 1,342,725 | 1,065,895 | 322,799 |
| | | 7,472,500 | 8,790,661 | 9,865,738 | 2,567,412 | 7,573,500 | 9,017,089 | 7,796,017 | 3,642,489 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් ඒකක 912 කට අදාලව රු.1,903,356 ක හිඟ ශේෂයක් හා කඩ කාමර 4 කට අදාලව රු.76,167 ක හිඟ ශේෂයක් අයවිය යුතුව තිබුණි. වරිපනම් හිඟයෙන් රු.778,916 ක් වූ ශේෂ 67 ක හිඟ කාල සීමාව වසර 3 ක් ඉක්මවා තිබුණි. | වරිපනම් හිඟයෙන් රු.314,471 ක් හා කඩකාමර හිඟයෙන් රු.58,820 ක මුදලක් අය කර ගෙන ඇති බව හා වරිපනම් සඳහා ජංගම සේවා පවත්වා හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ආ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක ද.ප.පා/ප.පා.කො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ II ඡේදයේ විධිවිධාන වලින් බැහැරව සභාව සතු තිබ්බොටුවාව කඩ සංකීර්ණයේ කඩකාමර 07 ක් වෙනත් පාර්ශවයන් වෙත සභාව අයකරන මාසික කඩ කුලියට වඩා ඉහල කුලී මුදලකට බදුකරුවන් විසින් අතුරු බදු දී තිබුණි. එසේම ඉහත චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව අතුරලිය ප්‍රාදේශීය සභාව සතු තිබ්බොටුවාව පොදු වෙළඳ | අතුරු බදුදුන් කඩකාමර පිළිබඳව සමීක්ෂණයක් සිදුකර වෙනත් පාර්ශවයන් සඳහා ලබාදී ඇති කඩකාමර සඳහා අදාල ගිවිසුම් ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරන බව හා මාළු ලැලී සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංකීර්ණයට අයත් මාළු ලැලි 05 කට අදාලව අයකල යුතු එක්වන් මුදල වූ රු.2,447,500 ක් අයකර ගෙන නොතිබුණි. | | |
| (ඇ) | තිබ්බොටුවාව කඩ කාමර සංකීර්ණයේ කඩ කාමර 06 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබුණු අතර මෙම කඩ කාමර සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කර ඒවා බදුදීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | මෙම කඩකාමර පිළිබඳව සමීක්ෂණයක් සිදුකර වෙනත් පාර්ශවයන් සඳහා ලබාදී ඇති කඩකාමර සඳහා අදාල ගිවිසුම් ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරන බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.420,000 ක් හා මුද්දර ගාස්තු රු. 9,051,770 ක් විය. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෛනිකව කසල ටොන් ½ ක් පමණ සහා බලප්‍රදේශයේ එක්රැස් කරන අතර නොදිරන කසල ගොඩපිටිය රසීනාවත්ත නමැති පෞද්ගලික ඉඩමකට බැහැර කර තිබුණි. ඒ අනුව නොදිරන කසළ පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | ප්‍රතිචක්‍රීකරණය කල හැකි නොදිරන ද්‍රව්‍ය මාතර මහ නගර සභාව වෙත ලබා දීමටත්, ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි ද්‍රව්‍ය පුද්ගලික ඉඩමක බිම් පිරවුමක් ලෙස යොදනු ලබන බව. | විධිමත් කසළ කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සියළුම පළාත් පාලන ආයතන විසින් මහජනයා වෙත ලබා දෙන සේවා පහසු කිරිම, කාර්යක්ෂම කිරීම සහ ආදායම් කඩිනමින් එක්රැස් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේද හඳුන්වාදීම අනිවාර්ය වුවත් සභාව සඳහා වෙබ් | 2024 මැයි මාසය තුළ වෙබ් අඩවිය නිර්මාණය කර මාර්ග ගත ක්‍රමයට ගෙවීම් පහසුකම් ලබා දීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

අඩවියක් නිර්මාණය කර ගෙවීම් පහසුකම් සැලසීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 මතභේදයට තුඩු දුන් ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------- | ----------- |
| (අ) | වාර්ෂික සම්මේලනයකට සහභාගී වීම සඳහා සභාවේ නිලධාරීන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් රු.127,000 ක් බාහිර පාර්ශවයන් වෙත ගෙවා තිබුණු අතර මෙවැනි ගෙවීම් සඳහා කිසිදු නෛතික ප්‍රතිපාදනයක් සලසා නොතිබියදීත් පෞද්ගලික පාර්ශවයන් වෙත සභා අරමුදලින් ගෙවීම් කිරීම නෛතික ගෙවීමක් නොවන බව නිරීක්ෂණය විය. | ආණ්ඩුකාරවරයාගේ හා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලැබීමෙන් පසුව ගෙවීම් සිදු කර ඇති බව. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2015 වර්ෂයේදී G.I ගැල්වනයිස් බට 512 ක් අතුරලිය ප්‍රාදේශීය සභාව වෙත ලැබී තිබුණ ද 2024 පෙබරවාරි 10 දින වන විට එහි පැවති බට 118 ක ඌනතාවය පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට හෝ ලබාදුන් පාර්ශවයන් වෙතින් නැවත ගෙන්වා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | G.I ගැල්වනයිස් බට ඌනතාවය සම්බන්ධව සමීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | -------------------- | ---------- |
| සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 4 දෙනෙකු, කාර්යාල කාර්ය සහායකයෙකු හා පුස්තකාල සහායකයෙකු වෙත තනතුරට අදාල නියමිත රාජකාරි පැවරීමකින් තොරව රාජකාරි පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.2,330,993 ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි. | ආයතනයේ සේවා අවශ්‍යතාවය මත රාජකාරි පැවරීම් සිදු කර ඇති බව හා බඳවා ගෙන ඇති තනතුරට හිමි වැටුප පමණක් ගෙවන බව. | තනතුරට අදාල රාජකාරී පැවරීම් සිදු කළ යුතුය. |